**ශීර්ෂය 108 - තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 108- තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

## 2.1 විසර්ජන ගිණුම

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 130.90 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 127.73 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 3.17 ක් හෙවත් සියයට 2.4 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 101.70 | 98.64 | 3.06 | 3.01 |
| මූලධන | 29.20 | 29.09 | 0.11 | 0.38 |
| **එකතුව** | **130.90** | **127.73** | **3.17** | **2.42** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 10801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.00 | 2.87 | 1.80 | 2.89 | 25.00 | 10.63 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0349/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු. මිලියන 9.03 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 0.99 ක් විය.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0130/000 | 0.06 |
| 6000/0000/00/0016/0079/000 | 0.67 |
| 6000/0000/00/0018/0016/000 | 0.26 |
| **එකතුව** | **0.99** |

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

------------------------------------------------

**3.1 විසර්ජන ගිණුම**

------------------

**අයවැය විචලනය**

----------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු. මිලියන 1.88 ක් විය. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 56 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 10801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධව විගණනයට ඉදිරිපත් කළ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීමට හිඟව තිබුණු ශේෂවල එකතුව රු. 146,611 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවැත එමින් තිබුණද, 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

-----------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------

මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙත වාහනයක් ලබා දී තිබුණද, එය විධිමත් පරිදි පවරා දී නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

-------------------------------------------------------------

මුදල් අමාත්‍යාංශයට අයත් වාහනයක් අමාත්‍යාංශය වෙත විධිමත් පරිදි පවරා නොගෙන අමාත්‍යාංශයේ කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. එම වාහනය අනතුරකට පත්වීමෙන් පසු නඩු භාණ්ඩයක් ලෙස ගල්කිස්ස උසාවි භූමියේ ගාල්කර තිබුණු බැවින් එම වාහනය පවරා ගැනීමට හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට හෝ නොහැකි වී තිබුණු බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2016 ජූලි 26 දින මා වෙත දන්වා තිබුණි.

**( ඈ) බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

මුදල් රෙගුලාසි 94(1) ට අනුකූල නොවී විෂයයන් 16 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 24.68 ක බැරකම්වලට එළඹ තිබුණි. එම බැරකම්වලින් රු.මිලියන 12.69 ක් 2014 වර්ෂයේදී පරිගණක හා උපාංග ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් විය.

## 3.4 අනුකූල නොවීම්

**------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | අමාත්‍යාංශය සතු වාහනවල ඉන්ධන පරීක්ෂාව මාස 06 කට වරක් සිදුකර නොතිබුණි. |
| (ii) 2011 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන චක්‍රලේඛය | අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ මාසික රාජකාරී හා පෞද්ගලික කටයුතු සඳහා වූ අනුමත ඉන්ධන ප්‍රමාණය ඩීසල් ලීටර් 225 ක් වුවද, අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 ජනවාරි 29 දින සිට 2015 මැයි 13 දින දක්වා අනුමත ඉන්ධන දීමනාව ඉක්මවා රු.95,743 ක අතිරේක ඉන්ධන ලබාගෙන තිබුණි. |
| **(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | |
| 2015 ජූලි 10 දිනැති 02/2015 දරන චක්‍රලේඛය | අමාත්‍යාංශය සතු අපහරණය කළ යුතු වාහන 04 ක් සම්බන්ධව අදාළ චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

## 3.5 කාර්යසාධනය

**----------------**

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

## 3.5.1 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නවීන තැපැල් සේවයක් ලබාදීම සහ එය කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම අමාත්‍යාංශයේ එක් අරමුණක් වූ අතර තැපැල් කාර්යාල ජාලය වැඩිදියුණු කිරීම මගින් මෙම ඉලක්කය ලඟාකර ගැනීම කළ යුතු කාර්යයක් විය. 2014 වර්ෂයේදී අවසන් කළ යුතු වූ මෙම ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 648.81 ක් වී තිබුණත්, රු. මිලියන 539.11 ක් පමණක් වැය කර තිබුණි.

(ආ) තැපැල් කාර්යාල ජාල ගතකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාවෙහි තැපැල් කාර්යාල 647 ක් හා උප තැපැල් කාර්යාල 3,410 ක් ජාලගත කිරීමට නියමිතව තිබුණද, ව්‍යාපෘතිය මගින් දිස්ත්‍රික් තැපැල් කාර්යාල හා ප්‍රධාන තැපැල් කාර්යාල 647 ක් පමණක් ජාලගත කර තිබුණි.

(ඇ) 2008 වර්ෂයේ ආරම්භ කර තිබූ තැපැල් කාර්යාල ජාලගත කිරීමේ ව්‍යාපෘතිය මගින් තැපැල් දෙපාර්තමේන්තුව දිගින් දිගටම අලාභ ලැබීම වලක්වා ආදායම හා වියදම සම තත්ත්වයෙන් පවත්වා ගැනීම ප්‍රධාන අරමුණක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම තත්ත්වයට ලඟාවීමට නොහැකි වී තිබුණි. 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අලාභය ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 45.5 ක සිට සියයට 75 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට ජාලගත කරන ලද උපකාරක සේවාවන්වලින් ලැබෙන ආදායම්වලට අදාළව පරිගණක අංශයෙන් ලබාගත් වාර්තාව හා තථ්‍ය ආදායම් වාර්තාව අනුව ආදායම් විෂයයන් 06 ක ආදායම රු. මිලියන 80.89 කින් වෙනස් වී තිබුණි. මේ අනුව එකතු කර ගන්නා ලද තථ්‍ය ආදායම පරිගණක වාර්තාවලින් අනාවරණය කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂය සඳහා වූ මුදල් ඇණවුම් ගිණුම පිළියෙල කිරීමේදී හඳුනාගෙන තිබූ MORS මෘදුකාංගයේ පහත සඳහන් දුර්වලතාවයන් අනාවරණය විය.

(i) පරිගණක පහසුකම් නැති උප තැපැල් කාර්යාලවල මුදල් ඇණවුම් කලට වේලාවට පරිගණකයට ඇතුළත් කිරීමට නොහැකි වී තිබුණි.

(ii) දෛනික මුදල් ඇණවුම් වාර්තාව නියමිත වෙලාවට ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(iii) සමහර අවස්ථාවල මුදල් ඇණවුම්, පැඩි පද්ධතියට ඇතුළත් කිරීමටයාමේදී එසේ කිරීමට නොහැකි වී තිබුණි.

(iv) මෘදුකාංගයට මුදල් ඇණවුම් ලැබීම්, ගෙවීම් ඇතුළත් කළද, සාරාංශ වාර්තාවේ එය පෙන්නුම් කර නොතිබුණි.

(v) දිසා ගිණුම් කාර්යාලවලදී ගෙවන මුදල් ඇණවුම් කොමිස් මුදල් පිළිබඳ සාරාංශයක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඊ) පරිගණක මෘදුකාංගයේ ඇතුළත් තොරතුරුවල ඉහත සඳහන් දුර්වලතා පැවැතීම නිසා 2014 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ මුදල් ඇණවුම් ගිණුම සැසඳුම් ප්‍රකාශයේ සඳහන් ශේෂ හා පරිගණක මෘදුකාංගයේ සඳහන් ශේෂ අතර පහත සඳහන් පරිදි වෙනස්කම් අනාවරණය විය.

| විස්තරය | පරිගණක මෘදුකාංග අනුව ශේෂය | මුදල් ඇණවුම් ගිණුම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| මුදල් ඇණවුම් නිකුත් කිරීම | 11,337.26 | 12,173.17 | 835.91 |
| මුදල් ඇණවුම් ගෙවීම | 11,021.29 | 12,116.59 | 1,095.30 |
| මුදල් ඇණවුම් කොමිස් ආදායම | 107.06 | 108.64 | 1.58 |

(උ) ඉකුත් වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව ජාල මෘදුකාංගය සංවර්ධනය කර අවසන් වූ පසු ජාතික ජල සම්පාදනය හා ජලප්‍රවහන මණ්ඩලය සමඟ තැපැල් දෙපාර්තමේන්තුව ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු ජල බිල්පත් ගෙවීමේ කාර්ය ආරම්භ කළ යුතුව තිබුණි. එම කාර්යයට ඉටුකිරීම සඳහා ජාල මෘදුකාංගයට 2016 ජුලි 21 දින වන විටත් ඇතුළත් කර නොතිබුණි.

(ඌ) සාමාන්‍ය ක්‍රමය යටතේ විදුලි බිල්පතකට මුදල් ගෙවීමෙන් පසු බිල්පත් ගිණුම තුලනයවීමට දින කිහිපයක් ගතවීම හා පාරිභෝගික අවශ්‍යතා එකම ස්ථානයකින් ඉටුකර ගැනීමට නොහැකි වීම නිසා එම සේවාවන් ලබාගැනීමට තැපැල් කාර්යාලවලට පැමිණෙන පාරිභෝගිකයන් වෙනත් නවීන තාක්ෂණික ක්‍රමවලට යොමු වී තිබුණි.

(එ) තැපැල් ජාල ව්‍යාපෘතිය යටතේ මුද්දර තොග පාලන ගිණුම් තැබීම සඳහා මුද්දර පරිගණක මෘදුකාංගයක් හඳුන්වා දී තිබුණද, එය මුද්දර කාර්යාංශයේ කටයුතුවලට පමණක් සීමාවී තිබුණි. ඒ අනුව මුද්දර සුරක්ෂිතාගාරය, මුද්දර ගබඩාව හා තැපැල් කාර්යාලවල මුද්දර ඇණවුම් කිරීම, මුද්දර නිකුත් කිරීම, තොග පාලනය හා ගිණුම් කටයුතු මේ මගින් ආවරණය කර නොතිබුණි.

(ඒ) දෙපාර්තමේන්තුව මගින් විදුලි බිල්, දුරකථන බිල්, රක්ෂණ ගාස්තු ආදිය එකතු කිරීමේදී පිට පළාත්වලින් සැලකිය යුතු ප්‍රමාණයක බිල් එකතු කර තිබුණද බස්නාහිර පළාතේ එය අඩු අගයක පැවතුණි. කාර්ය බහුල ජනතාව පහසු හා ඉක්මන් ක්‍රම මගින් ඔවුන්ගේ අවශ්‍යතාවය ඉටුකරගන්නා බැවින් නාගරීකරණය හා තාක්ෂණයේ දියුණුවත් සමගම තැපැල් කාර්යාල මගින් කරනු ලබන එම සේවාවලින් ඉවත්වීමේ ප්‍රවනතාවයක් පවතින බව නිරීක්ෂණය විය. එබැවින් අනෙකුත් ආයතන සමඟ තරඟ කළ හැකි පහසු හා ඉක්මන් ක්‍රමවේදයක් ජාල ව්‍යාපෘතිය මගින් හඳුන්වා දී ගනුදෙනුකරුවන් තැපැල් කාර්යාල වෙත රඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) ජාල ව්‍යාපෘතිය හරහා බිල්පත් ගෙවීමේදී පද්ධතිය අක්‍රිය වන අවස්ථාවලදී වෙනත් ක්‍රමයක් මගින් පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවය ඉටුකර දීමට කටයුතු නොකර උප තැපැල් කාර්යාලවලට යොමු කරන අවස්ථා හා නැවත වෙනත් දිනයක පැමිණෙන අවස්ථා විය.

(ඕ) ජාලගත කර තිබූ තැපැල් කාර්යාල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන අංශය විසින්ද, විවිධ අවස්ථාවල අඩුපාඩු පෙන්වා දී තිබුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### 3.6.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම

**(අ) අමාත්‍ය කාර්යාලය නවීකරණය කිරීම**

අමාත්‍ය කාර්යාලය නවීකරණය කිරීම සඳහා 2015 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අනුව රු. 2,450,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. 2015 වර්ෂයේදී මේ සඳහා රු.2,217,675 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නවීකරණ කටයුත්ත සඳහා මුල් වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.150,000 ක ප්‍රතිපාදන සළසා තිබුණත්, 2015 අප්‍රේල් 29 දින වන විටත් අවශ්‍ය ප්‍රතිපාදන සළසා නොගෙන එම කටයුත්ත ඉටු කිරීම සඳහා රු.2,421,100 ක කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

(ii) සීමිත ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයතන 07 කින් මිල ගණන් කැඳවා තිබුණද, ආයතන 04 කින් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඉතිරි ආයතන 03 සඳහා ලංසු කැඳවීමේ ලිපි යැවූ බව පිළිගැනීමට සනාථ කෙරෙන සාක්ෂි ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(iii) මේ අනුව වඩා තරඟකාරී මිලගණන් ලබාගැනීමට තිබූ අවස්ථාව ආයතනයට ලැබී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තු මිල රු.203,400 කින් ඉක්මවා ඉදිරිපත් කර තිබුණු මිල ගණන අවම මිල ලෙස පිළිගැනීමට සිදු වී තිබුණි.

(iv) ඉදිරිපත් කළ මිල ගණන් ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබාගැනීමෙන් තොරව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

**(ආ) පරිගණක, මුද්‍රණ යන්ත්‍ර හා අඛණ්ඩ විදුලි සැපයුම් ඒකක මිලදී ගැනීම**

අමාත්‍යාංශය සඳහා පරිගණක 04 ක්, මුද්‍රණ යන්ත්‍ර 01 ක් හා අඛණ්ඩ විදුලි සැපයුම් 04 ක් 2015 අප්‍රේල් 08 දින රු.426,104 කට මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගීවීම සඳහා සාධාරණ, සමාන හා උපරිම අවස්ථාවක් ලබා නොදී අමාත්‍යාංශය විසින් එක් ආයතනයකින් පමණක් ලංසු කැඳවා තිබුණි.

(ii) මෙම මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු ලංසුව තාක්ෂණ ඇගැයීම් කමිටුව වෙත ඉදිරිපත් එහි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(iii) ලංසු ඉදිරිපත් කිරීම සඳහා සම්මත පිරිවිතර සහිත ලංසු පත් පිළියෙල කර නොතිබුණු අතර 2015 මාර්තු 24 දින එක ආයතනයකින් පමණක් මිල කැඳවීම සිදුකර ගණකාධිකාරීවරයා විසින් අදාළ ආයතනයට 2015 මාර්තු 31 දින වන විට භාණ්ඩ සපයන ලෙස දන්වා තිබුණි.

### 3.7 පාඩු හා හානි

--------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ඇ) 2014 නොවැම්බර් 25 දින සිදුවූ වාහන අනතුරක් හේතුවෙන් රු.296,951 ක අලාභහානියක් සිදු වී තිබුණත්, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පූර්ණ වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 03 කට අදාල පරීක්ෂණ නිමකර අලාභය තක්සේරු කර නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශයේ අලාභ හානි ලේඛනයේ වාහන අනතුරු 02 ක් සම්බන්ධ විස්තර ඇතුලත් කර නොතිබුණි.

### 3.8 කළමනාකරණ දුර්වලතා

--------------------------

2015 මැයි 05 දින සිට මැයි 11 දින දක්වා හජ් වන්දනාව සඳහා සෞදි අරාබියට යන බැතිමතුන්ගේ පහසුකම් සොයා බැලීම සඳහා විෂය භාර අමාත්‍යවරයා, අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් හා අමාත්‍යාංශයේ ලේකම්වරයා සෞදි අරාබියට යාම සඳහා අනුමැතිය ඉල්ලා තිබුණු අතර ලේකම්වරයාට හැර අනෙකුත් නිලධාරීන්ට 2015 අප්‍රේල් 28 දින අදාළ අනුමැතිය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංචාරය සඳහා අනුමැතිය ලැබීමට පෙර එනම් 2015 අප්‍රේල් 27 දින සියළු නිලධාරීන් සඳහා විදේශ ගමන් වියදම් දීමනා ගෙවා තිබුණි. ලේකම්වරයා විසින් ලබාගෙන තිබුණ රු.285,600 ක මුදල මාස 2 කට අධික කාලයක් අත රඳවාගෙන 2015 ජූලි 07 දින නිරවුල් කර තිබුණි.

(ආ) මෙම සංචාරය සඳහා අදාළ වැය විෂය යටතේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම නිසා අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු නොකර හජ් අරමුදලෙන් රු.385,928 ක් වැය කර තිබුණි.

**3.9** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යා පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 14 | - |
| (ii) | තෘතීයික මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීක මට්ටම | 61 | 46 | 15 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 30 | 26 | 04 |
| | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 04 | 03 | 01 |
| | **එකතුව** | **113** | **91** | **22** |